www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

48376

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | කාලය / காலம் / Time | පැය 02යි. |
|---|---|---|---|---|---|---|---|

නම:-............................................ විභාග අංකයා:-..........................................

සැලකිය යුතුයි.
- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 - 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. අපේ රටේ ඉතිහාසය හැදෑරීමට ඉවහල්වන දේශීය සාහිත්‍ය මූලාශ්‍රය අතුරින් වඩාත් ම පැරණි මූලාශ්‍රය වන්නේ
1. මහාවංසය යි.
2. දීපවංසය යි.
3. ථූපවංසය යි.
4. බෝධිවංසය යි.

02. "නිහාරිකාව" යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබන්නේ මින් කුමක් ද?
1. තාරකාවකි. 2. ග්‍රහලෝකයකි. 3. දූවිලිවළාවකි. 4. සත්වයෙකි.

03. ගිනිකඳු පුපුරන විට ඉන් පිටතට ගලා එන ද්‍රව හඳුන්වන්නේ කුමන නමින් ද?
1. නෙබියුලා 2. ස්ඵටික 3. ගින්දර 4. ලාවා

04. ගල් ගුහාවක තිබී මැටියෙන් සෑදූ ඉතා පැරණි දැකැත්තක් හමුවූයේ,
1. ඊශ්‍රායලයෙන් ය. 2. ඊජිප්තුවෙන් ය. 3. ඉරාකයෙන් ය. 4. චීනයෙන් ය.

05. පහත 'අ' තීරුව සහ 'ආ' තීරුව නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. බඩ ඉරිඟු | A - මධ්‍යධරණී ප්‍රදේශය |
| 2. තිරිඟු | B - චීනය |
| 3. වී | C - මධ්‍යම මෙක්සිකෝව |

1. A, B, C 2. B, A, C 3. C, A, B 4. A, C, B

06. ශිෂ්ටාචාර ආරම්භවීමටත් පෙර සමාජය තුළ දුප්පත් පොහොසත්භාවය ඇතිවීමට හේතු වූ සාධකය වන්නේ,
1. වෙළඳාම් කළ ද්‍රව්‍යවල ඇති වූ වෙනස්කම් ය.
2. අධ්‍යාපන මට්ටමේ ඇති වූ වෙනස්කම් ය.
3. අස්වැන්න ලබා ගැනීමේ දී ඇති වූ වෙනස්කම් ය.
4. ඉදිකරගත් නිවාසවල පැවති වෙනස්කම් ය.

07. ගොවිතැන් කිරීමට පුරුදු වූ මේ රටේ පැරණිතම ජනතාව ජීවත් වූයේ
1. තැනිතලා ප්‍රදේශවල ය.
2. වෙරළබඩ ප්‍රදේශවල ය.
3. වනාන්තර ප්‍රදේශවල ය.
4. කඳුකර ප්‍රදේශවල ය.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

08. පළමුවරට රබර් බෝලයක් සාදන ලද බවට තොරතුරු හමුවූයේ මින් කුමන ශිෂ්ටාචාරයෙන් ද?
1. මායා ශිෂ්ටාචාරය.
2. චීන ශිෂ්ටාචාරය.
3. ඉන්දුනිම්න ශිෂ්ටාචාරය.
4. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය.

09. පහත සඳහන් කරුණු අතරින් මෙසපොතේමියානු ශිෂ්ටාචාරයට අයත් නොවන වගන්තිය තෝරන්න.
1. යුප්‍රටීස් ටයිග්‍රීස් යන ගංගා නිම්න අසල බිහිවිය.
2. මළ සිරුරු කල් තබා ගැනීමේ ක්‍රම දන සිටිය හ.
3. තිරිඟු සහ බාර්ලි වගා කළ හ.
4. පැරණිතම අක්ෂර පද්ධතිය නිපදවී ය.

10. "හැකි මිනිසා" යන අර්ථයෙන් හඳුන්වන ලද මානව වර්ගය මින් කවරෙක් ද?
1. ඔස්ට්‍රලෝපිතිකස්
2. හෝමෝ ඉරෙක්ටස්
3. හෝමෝ හැබිලිස්
4. හෝමෝ නියැන්ඩතාලෙන්සිස්

11. ● පූජකයෙක් යැයි සැලකෙන මූර්තියක් හමුවීම
● ප්‍රවාහනයට යොදාගත් කරත්තයක අනුරුවක් හමුවීම
ඉහත සඳහන් තොරතුරුවලට අදාල වන ශිෂ්ටාචාරය තෝරන්න.
1. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය
2. ඊජිප්තු ශිෂ්ටාචාරය
3. චීන ශිෂ්ටාචාරය
4. ඉන්දුනිම්න ශිෂ්ටාචාරය

12. ඓතිහාසික මූලාශ්‍රය අනුව විජය කුමරු ඇතුළු පිරිස ගොඩබසින ලද ස්ථානය හඳුන්වන්නේ කුමන නමින්ද?
1. තම්බපණ්ණි
2. මාතොට
3. හලාවත
4. යාපනය

13. මුල් කාලීන ගොවියන් ධාන්‍ය වර්ග ආහාරයට ගත් බව පෙන්වන සාක්ෂියක් වන්නේ,
1. මැටි වළං සොයා ගැනීම
2. ඇඹරුම් ගල් සොයා ගැනීම
3. පැරණි යකඩ ලෝහ උපකරණ සොයා ගැනීම
4. වරිච්චි ගෙවල්වල ජීවත් වූ බවට සාධක හමුවීම

14. ● ථූපාරාමය ඉදි කිරීම
● ලහබත්ගේ නමින් දාන ශාලාවක් කරවීම
ඉහත සඳහන් කාර්යයන් ඉටුකළ රජතුමා කවුරුන් ද?
1. දේවානම්පියතිස්ස රජතුමා.
2. දුටුගැමුණු රජතුමා.
3. සද්ධාතිස්ස රජතුමා.
4. මහසෙන් රජතුමා.

15. සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය රැගෙන මෙරටට පැමිණි වරාය
1. ගෝකණ්ණතිත්ථ ය.
2. මහාතිත්ථ ය.
3. ලංකාපටුන ය.
4. දඹකොළ පටුන ය.

16. තිස්ස කුමරු විසින් සශ්‍රීක කොට වගා කටයුතු කළ දිගාමඩුල්ල ප්‍රදේශය වර්තමානයේ හඳුන්වනු ලබන්නේ කුමන නමින් ද?
1. ත්‍රිකුණාමල ප්‍රදේශය
2. අම්පාර ප්‍රදේශය
3. රුහුණු ප්‍රදේශය
4. මාගම ප්‍රදේශය



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

17. රජුගේ ආරක්ෂාව වෙනුවෙන් තම ජීවිතය ගැන නොසලකා සතුරන් අතට පත් වූ වීර කාන්තාව
    1. අනුලා දේවිය යි.
    2. විහාරමහා දේවිය යි.
    3. සුගලා දේවිය යි.
    4. සෝමා දේවිය යි.

18. වළගම්බා රජතුමාගේ රාජ්‍ය කාලයේ දී සිදු වූ සිද්ධියක් වන්නේ
    1. ලෝවාමහාපාය ඉදිකිරීම.
    2. නොච්චිපොතාන වැව ඉදිකිරීම.
    3. බැමිණිතියාසාය නමින් සාගතයක් ඇතිවීම.
    4. නගරයේ ආරක්ෂාව උදෙසා දිය අගලක් ඉදිකිරීම.

19. පැරණි කාලයේ ආසියාවේ ඉදි වූ උසම ගඩොළු ගොඩනැගිල්ල ලෙස සැලකෙන්නේ
    1. ජේතවන දාගැබ  2. අභයගිරි දාගැබ  3. රුවන්මැලි සෑය  4. ථූපාරාම දාගැබ


20. විශිෂ්ට වාරි නිර්මාණයක් වූ යෝධ ඇළ මගින් ජලය රැගෙන යනු ලැබුවේ මින් කුමන වැවට ද?
    1. කලාවැවට ය.  2. තිසා වැවට ය.  3. යෝධ වැවට ය.  4. හුරුළු වැවට ය.

(ලකුණු 2 × 20 = 40)


## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

01. A සහ B වශයෙන් දක්වා ඇති පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A 

(i) A පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
(ii) මෙය සොයාගත්තේ කුමන ස්ථානයකින් ද?
(iii) මෙය තැනීමට භාවිතා කර ඇති ද්‍රව්‍ය කුමක් ද?
(iv) මේවා තනා ඇත්තේ කවුරුන් විසින් ද?

B 

(i) B පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
(ii) ලෝකයේ පුදුම හතෙන් එකක් ලෙස සැලකෙන මේවා පිහිටි ස්ථානය නම් කරන්න.
(iii) මේවා කුමන ශිෂ්ටාචාරයකට අයත්වේද?
(iv) මෙහි තැන්පත් කර ඇති මෘතදේහ අයත් රජවරුන්ගේ පෙළපත් නාමය ලියන්න.

(2 × 8 = ලකුණු 16)

02. (i) ඉතිහාසය හැදෑරීමට ඉවහල්වන පුරා විද්‍යාත්මක මූලාශ්‍රය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔබේ පාසලේ ඉතිහාසය දැනගැනීමට උපකාරී වූ මූලාශ්‍රය හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ඉතිහාසය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

03. (i) පහත සඳහන් යුගවලදී සිදු වූ විශේෂ සිදුවීම අනුපිළිවෙළින් ලියන්න.

(a) - පැලියොසොයික යුගය

(b) - සිලුරියන් යුගය (ලකුණු 02)

(ii) හෝමෝසාපියන් මානවයා සතුව පැවති කුසලතා දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) නවශිලා යුගයේ දී ඇති වූ වෙනස්කම් පහක් ලියන්න. (ලකුණු 05)

04. (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) චීන ශිෂ්ටාචාර වැසියන් ලෝකයට හඳුන්වා දුන් නව නිර්මාණ හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) මෙසපොතේමියානු සමාජය සකස් වී තිබුණු ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

05. (i) ශ්‍රී ලංකාවේ මුල් ජනාවාසවල ජීවත් වූ අපේ මුතුන් මිත්තන් ඔවුන්ගේ කටයුතු සඳහා මෙවලම් තනා ගැනීමට භාවිතා කළ ද්‍රව්‍ය දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) මුල් ජනාවාසවල ජීවත් වූ ජනතාව ආහාරය සඳහා දඩයම් කළ සත්ත්ව වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ මුල් ජනාවාසවල ජීවත් වූ ජනතාව පිළිබඳ පහත සඳහන් ශීර්ෂ යටතේ කෙටි විස්තරයක් ලියන්න.

(a) ආභරණ පැළඳූ බව (b) අවමංගල්‍ය චාරිත්‍ර ඉටුකළ බව (ලකුණු 05)

06. (i) වසභ රජතුමා සම්බන්ධ පහත තොරතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(a) වසභ රජතුමා යාපනය ප්‍රදේශය පාලනය කිරීමට පත්කළ ඇමතිවරයාගේ නම

(b) එම තොරතුරු සඳහන් වන මූලාශ්‍රය හඳුන්වන නම (ලකුණු 02)

(ii) වසභ රජතුමා බුදු දහමේ දියුණුව උදෙසා ඉටුකළ කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) වසභ රජතුමා රටේ දියුණුව සඳහා සිදුකළ වාරි කර්මාන්ත කටයුතු සහ අනුරාධපුර නගරය වැඩි දියුණු කිරීමට කළ කටයුතු විස්තර කරන්න. (ලකුණු 05)

07. (i) මහසෙන් රජතුමාගේ පියාගේ නම සහ සහෝදරයාගේ නම පිළිවෙළින් ලියන්න. (ලකුණු 02)

(ii) මහසෙන් රජතුමා විසින් ඉදිකරනු ලැබූ වෙහෙර විහාර හතරක නම් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මහසෙන් රජතුමා ජනතාව අතර දේවත්වයට පත්වීමට හේතු වූ කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk